කෙටි කතාව

# නරක වෙලාව

සනත් පියසේන

**ඉන්පසු කිසිවක් කියන්නට මතක නැත. එහෙත් මහා බියකරු දර්ශනයක් මා ඉදිරියේ මැවී පෙනේ. ඇස් යළි පියා ගැනීමට අපහසුවා මෙනි. ඇස් පියාගත් විගස ම මා ඉදිරියේ උපහාසාත්මක මුහුණින් බලා සිටින්නේ මාගේ බිරිඳ ය. එහි තෙත් ගතියක් හෝ කාරුණාවක් නැත. දෙසවන් දෝංකාරය දී ඇසෙන්නේ " යන්කො ගෙදර" යන බියකරු වචන දෙක පමණි.**



මේ, මා මහන්සි ගන්නේ දෙනෙත් හැර ගැනීමට නොවේද ? දෑස් පියන්පත් එකට තද වී ඇති බවක් දැනෙයි. දිග හැරීමට අපහසු ය. වෙනදාට නින්දෙන් පසු හිරිගැට හැර දෙනුවන් හරින්නේ කොතරම් පහසුවෙන්ද. එහෙත් අද ? මුළු ශරීරයම වෙර ගෙන දෑස් හැරීමට මහන්සි ගනිමි. යන්තම් මිදුම් පටලයක් දක්වා හැරෙන ඇස් නැවතත් පියැවෙන්නේ ඉබේට ම ය. තවත් තරමක වේලාවකින් පසු නැවත දෑස් හැරීමට මහන්සි ගනිමි. මෙවර කලින්ට වඩා ඇස් විවෘත වුණු බව දැනේ. එහෙත් මී දුමක් දක්වා පමණය. වටපිට කිසිවක් නොපෙනේ.

නින්දෙන් අවදි වුණු විගස මා අසල නිදා සිටින බිරිඳ ගේ ගෙල වටා අතක් යැවීමේ පුරුද්ද මත වම් අත එසවීමට තැත් කළ ද, අත එසවෙන්නේ නැත. යළි ඇස් ඇරීමට වෙහෙස වෙමි. මෙවර කලින්ට වඩා තරමක් වැඩියෙන් දෑස් විවෘත වේ. එහෙත් සම්පූර්ණයෙන් නොවේ. මීදුම අතරින් ඡායාවන් කිහිපයක් මා වටා සිටින බව යාන්තම් පෙනේ. කීපවාරයක දැඩි වෙහෙසකින් පසුව වටාපිටාව දකින අයුරින් දෑස් විවෘත විණි. මගේ හිසට ඉහළින් ඇති බෝතලය සේලයින් බෝතලයක් සේ වටහා ගැනීමට තරමක වේලාවක් යන්නට ඇත. දෑස කරකැවී වටාපිටාවට යොමු වන්නට තවත් වේලාවක් ගත වෙන්නට ඇත.

වෛද්‍ය නලාවක් කරේ පටලවා ගත් පුද්ගලයා වෛද්‍යවරයකු ලෙස සිතා ගැනීමට පුළුවන. ඒ සමගම සිටින ඡායාව හෙදියක් යයි අනුමාන කරමි. දෙදෙනොම මා දෙස බලා සිටින්නේ ඉතාමත් විමසුම් සහිතව බව පෙනේ. ඔවුන් නගන ශබ්දය වටහා ගැනීමට නොහැකි ය. තවත් තරමක වේලාවකින් පසු ඔවුන් ඉතාමත් පැහැදිලි ය. දෙදෙනාගේ ම මුහුණු වල ඇත්තේ ජයග්‍රාහී පෙනුමකි.

"මිස්ටර් ජයබන්ධු, මිස්ටර්, මිස්ටර්." මාරුවෙන් මාරුවට ඇසෙන ශබ්දය ඔවුන්ගේ ය. එහෙත් ඔවුන්ට උත්තර දීමට පැහැදිලිව කිසිවක් මට සිතා ගත නොහැකි ය. මෙය රෝහලක් බව වටහා ගැනීමට දැන් පුළුවන. විදුලි පංකා පෙති හෙමිහිට කරකැවේ. සේලයින් බෝතලයෙන් බින්දුව බින්දුව බටයට ඇතුළුවන බව පෙනේ. බටයේ කෙළවර මගේ ශරීරයට සම්බන්ධ වී ඇති බව ස්ථිර වශයෙන් ම සිතාගත හැකි ය. දැන් සියල්ල පැහැදිලි ය. මා දෙතොල වතුර බිඳක් තෙත් කළ කාරුණික හෙදිය "මිස්ටර් ජයබන්ධු" යනුවෙන් ඇමතූ සිහින් කට හඬට ප්‍රතිචාර දැක්වීමට ගත් මහන්සිය සාර්ථකය.

"හ්.......හ්"

ඇයගේ මුහුණේ ජයග්‍රාහී සිනහවකි.

සිදුවුණු සිද්ධිය කුමක් ද යි වටහා ගැනීමට තවත් වේලාවක් ගත විය. දැන් කෙමෙන් පැහැදිලිව සිතා ගත හැකි ය. මෙය ප්‍රධාන පෙළේ රෝහලක් විය යුතුය. සෑම දෙයක් ම මැනැවින් ඇත. දැන් වටා පිටාවෙන් ඇසෙන සියුම් ශබ්ද තේරුම් ගැනීමට හැකි ය. වාට්ටුවේ ඇති ශබ්ද විකාශන යන්ත්‍රයකින් වරින් වර නිකුත් කරන නිවේදන හරිහැටි පැහැදිලි කර ගත හැකි නොවන්නේ ප්‍රකාශ කරන ආකාරයේ නො පැහැදිලි බව නිසා විය යුතු ය.

එක් වරම මෙන් වාට්ටුව තුළ දිවයන ඔළුගෙඩි රාශියකි. ඒවා එහාට මෙහාට වේගයෙන් පාවෙනවා මෙනි. ඒ ලෙඩ්ඩු බලන්නට පැමිණෙන අය විය යුතුය. මා ඇඳ අසලට පැමිණි හිසක් මුහුණ දෙස කෙළින් ම බලා සිටී. ඒ මගේ බිරිඳ ය. කතාවක් නැත. දෑසින් කඳුලු වැගිරෙයි. තව තව පිරිස පැමිණ ඇඳ වටා සිටින බව පෙනේ. සැමගේ මුහුණුවල ඇත්තේ දැඩි සෝබර පෙනුමකි. ඒ ශෝකී පෙනුම මැදින්ම උපහාසාත්මක පෙනුමක් ද ඇතැයි සිතාගත හැකි ය. බිරිඳගේ මුහුණේ කණගාටුවකට වඩා කේන්තියක් දැයි සිතේ. ඇයගේ දෙනුවන් පවසන්නේ වේදනාවට වඩා පසුතැවිල්ලක කතාවකි.

එකිනෙකා කතා කරන ශබ්දයට අනුකූලව මට පිළිතුරු දීමට නො හැකි ය. කතා කිරීමට උවමනාවක් මට ද නැතුවා සේ ය. මා දැන්නම් කතා කරන්නට මහන්සි නොගන්නේ උවමනාවෙන් ම ය. ශරීරයේ වේදනාව නිසා ඉබේ කෙඳිරි ගෑවෙයි. මේ සියලු දෙනාම අසන ප්‍රශ්න වලට පැහැදිලිව උත්තර දීමට මට නොපුළුවන් බව දනිමි. සියල්ල විස්තර කිරීමට තරම් ශක්තියක් ද මා තුළ නැත.

"අන්න අනිත් එක්කෙනා අනික් වාට්ටුවේ." බොහෝවිට ඕනෑම දෙයකට කලින් කතා කරන, එමෙන් ම වැඩිපුර කතා කරන පොඩි අක්කා මාවෙත එල්ල කළේ උපහාසාත්මක පහරක් නොවෙ ද? දැන් සියල්ල එක දිගට සිහිපත් වේ. ටෙලි නාට්‍ය රූප පෙළක් මෙන් සියල්ල සිත තුළ එක දිගට පෙළ ගැසේ.

මා මහා වරදක් කළ අයෙකු සේ සලකන බව සියලු දෙනා ම මා දෙස බලා සිටින ඉරියව් තුළින් පැහැදිලිය. බිරිඳගේ හිස සෙලවෙන ආකාරය තුළ "යන්කො ගෙදර" යනුවෙන් පවසනවා වැනියයි මට සිතේ. දැන් මට ඇත්තේ තැති ගැන්මකි. මා කෙසේ කිවත් මගේ නිදහසට කරුණු ගොනු කර ගත නොහැකි වනු ඇත. මා සත්‍ය ඇති සැටියෙන් ම නොවලහා කීවත් ඒවා සත්‍ය යැයි පිළිගැනීමට කිසිවකු ඉදිරිපත් නොවනු ඇත. මා වෙනුවෙන් කතා කිරීමට කිසිවකු නොමැති බව මට විශ්වාස ය. සත්‍ය නියමාකාරයෙන් දන්නේත්, කියන්නට ඉන්නේත් රසී නංගී පමණ ය. ඇය කියන දෙයක් ද තවත් අයකු පිළි නොගන්නවා ඇත. තවමත් අවිවාහක රසී නංගීට මෙයින් ඇති වන හානිය බෙහෙවින් බලවත් විය හැකි ය. ඇය විවාහ ජීවිතයක් සඳහා වන යෝජනාවල දී මෙම සිද්ධිය ප්‍රශ්නයක් වෙන්නට බැරි කමක් නැත. ඇය ද මේ රෝහලේ ම ගැහැණු වාට්ටුවක නවතා ඇති වග පොඩි අක්කා ගේ කතාව තුළින් මට පැහැදිලි වී ඇත.

සිදු වී ඇති සිද්ධිය මා ඔබට පැවසිය යුතුව ඇත. බිරිඳගෙන් හෝ පවුලේ ඥාතීන්ගෙන් ලබාගත නොහැකි වන අනුකම්පාව මට ඔබගෙන් හෝ ලබා ගත යුතුයයි මගේ සිත මට බල කරයි. සිදු වී ඇති ශාරීරික ආබාධ කෙදිනක හෝ සුවකර ගත හැකි වනු ඇත. එහෙත් මගේ ජීවිතයේ ඉදිරි ගමනට කෙසේ බලපායි දැයි දැන් මගේ මනසට ඇතුළු වන්නේ මහා අඳුරු පණිවිඩ රාශියක් නොවේද ? රසී නංගී අපේ ගෙදරට ගෙවල් හත අටකට පමණ දුරින් සිටින, දුරින් අපට නෑ කමක් ද ඇති තරුණියකි. ගොඩපරහන්දිය පාරෙන් යනවා නම් ඇයගේ නිවස පසු කොට අපේ නිවසට යා යුතුය. අගනුවර රැකියාවක් සඳහා උදයේම පිටත්ව යන ඇය උදයට යන්නේ අපේ නිවස පසු කොට ගෙන හන්දියට යන තුරු පයින් ය. ඇය ආපසු එනු දිනපතාම දකින්නට නොලැබෙන්නේ ගොඩපරහන්දිය පැත්තෙන් එනවා විය යුතුය. ඇයගේ දින චරියාව වන උදයේ සෑම දිනකම අප ගෙය ඉදිරිපිටින් යනවා ඇරෙන්නට වෙන කිසිවක් දැන ගැනීමට අපට හැකියාවක් නැත. උවමනාවක් ද නැත.

අප තුළ ඇති එක ම විශේෂය නම් පාසල් අවධියේ ඇය හා මා අතර ඉතා සුළු කලක් පැවතුණු ප්‍රේම සම්බන්ධයයි. එම සම්බන්දය ඉදිරියට ගෙන යාමට නොහැකි වූයේ එය රහසක් වහයෙන් තබා ගැනිමට අප අපොහොසත් විම නිසා ය. දැන් මා විවාහකයෙකි. දරුවකුගේ ද පියෙකි. මේ කතන්දරය මා බිරිඳට කියා ඇත. එය බිරිඳට ද එතරම් ගණන් ගත යුතු ප්‍රශ්නයක් බවට පත් වී තිබුණේ නැත. රසී නංගිට විවාහයක් කර දීම සඳහා ඇයගේ දෙමාපියන් තවමත් කල්යල් බලනවා විය යුතු ය. ඉතා ප්‍රියංකර පෙනුමකින් යුතු ඇයට තවමත් විවාහයකට සම්ප්‍රාප්ත වීමට නො හැකි වූයේ ඇයි දැයි සිතා ගැනීමට නො හැකි ය. එහෙත් ඇය පිළිබඳව ඉඳ හිට ඇසෙන කතා තුළ ඇය ගේ චරිතය ගැන චරිත සහතිකය නිකුත් කරන අය ගමේ අඩුවක් නැත. එක් අයෙක් මාගේ බිරිඳ ය.

"උදේට ගිහින් ගොම්මනේ එන්නෙ. කවුද දන්නේ මොකක්ද කොරන රස්සාව කියලා. මොකෝ අපි පස්සෙන් යනවයැ. ඔය කියන්නෙ මිනිස්සු." මගේ බිරිඳගේ මුවින් පිටවූයේ රසී නංගී අපගේ නිවස ඉදිරිපිටින් රැකියාව සඳහා පිය නගන අවස්ථාවක ය.

එහෙත් ඇය නරක එකියක් යැයි පිළි ගැනීමට සාක්ෂි මට තවම හමු වී නැත. ඒ පිළිබඳව සෙවීම මට අයිති රාජකාරියක් නොවේ යැයි මා සිටියේ ස්ථිර අදහසකිනි. ගමේ සියලු ම පිරිස ඥාතීන් ලෙස සැලකීම සහ ආමන්ත්‍රණය කිරීම මගේ පිළිවෙළ ය. අයියා, අක්කා, නංගී, මල්ලී, මාමා, නැන්දා ආදී වශයෙන් නෑයන්ට ද නොනෑයන්ට ද ඇමතීම ගැමි සංස්කෘතියේ වැදගත් අංගයකි. කවුරු හෝ හමු වුණු විටක වචනයක් දෙකක් කතා කරනවාට වඩා වෙනත් වැඩිපුර ඇයි හොඳයියක්, ගනුදෙනුවක් පැවැත්වීමේ සිරිතක් මා ළඟ නැත. එහෙත් මේ සිදුවුණු සිද්ධිය පිළිබඳව මා කෙසේ විස්තර කළත් කිසිවකු පිළි නොගන්නවා ඇත. බිරිඳ නම් කෙසේවත් පිළි නොගන්නා අතර එම පළුද්ද ජීවිතාන්තය දක්වා ම ගෙන යනු ඇත. ඕනෑම කෙනෙක් පවසනු ඇත්තේ මා හා ඇය අතර අනියම් ආකාරයේ සම්බන්ධයක් තිබෙන්නට ඇත කියා ය. එසේ නැත්නම් මේ දෙන්නා එක මොටර් සයිකලයකින් ගියේ 'මොන මගුලකද' යි කෙනෙකුට ප්‍රශ්න කළ හැකි ය. අනතුර සිදු නොවුණා නම් මේ හොර මගුල අහු වෙන්නේ නැතැයි බොහෝ දෙනා කියනු ඇත.

"මං නං මේ මිනිහා එක්ක තවත් නම් දීග කන්නේ නැතැ" යි බිරිඳ අපේ ඥාතීන් හමුවේ කියනු ඇත. එහි ලොකු සාධාරණයක් ඇතැයි ඔවුන් ද අනුමත කරනු ඇත. මගේ නිර්දෝෂීභාවය ගැන ඇයට වටහා දීමට මහන්සි ගැනීම ද තේරුමක් නැතැයි සිතේ.

කකුල ඔසවා අනික් පැත්තට හැරෙන්නට හැදුවත් කකුලට ද හානි සිදු වී ඇති බවක් දන්නේ එය එතරම් පහසු කාර්යක් නොවන බව වැටහුණු නිසා ය. රසී නංගීට කුමක් සිදු වී ඇත්ද ? ඇයට මට වඩා අමාරුද ? මා ඇයට කළේ අපරාදයක් යැයි යන සිතුවිල්ල විසින් මා වෙළාගෙන ඇත.

ඊයේ රාත්‍රියේ මගේ රාජකාරියෙන් පසු නිවසට පැමිණීමට ආවේ වෙනදා එන පාරෙන් නො වේ. හදිසියේ හමු වූ පරණ මිතුරකු සමග පැයක හමාරක මත් සාදයකට කොටුවීමට සිදු වුණේ නගරයට නුදුරින් ඇති අවන්හලක දී ය. මතපැන් ගනුදෙනුවේ නිමග්න වී සිටි අපට රෑ වුණු බවක් වත් නො තේරුණි. මා නිවසට ඒමට යතුරු පැදියට ගොඩ වන විට රාත්‍රී අටහමාරත් පසු වන්නට ඇත.

"චෙරියෝ මචං. මං ගිහින් එන්නං" යන වචනය සමග ම සයිකලයේ රෝද තාර පොළවේ සිනිඳු සුවය විඳින්නට ඇත.

"පරිස්සමින් පලයං" එම වචනය මට ඇසුණේ යන්තමිනි.

මට ඒ තරම්ම මත් ගතියක් තිබුණේ ද නැත. සාමාන්‍ය තරමකට මත තිබුණත් මෝටර් සයිකලය පැද යාමට එය අපහසුවක් නොවේ.

"දෙවැනි බුදුන් ලෙස - ලොවම උදම් කළ - ලොවක පිදුම් ලද - ලොවට උතුම් ළඳ....... අම්මා ........ අම්මා........ මා" මුවින් විසිරුණේ පුරුද්දට මෙනි.

සයිකලය ගොඩපරගහ හන්දියෙන් හැරෙනවාත් සමග ම මා දුටුවේ බසයක් එනතුරු හින් පොද වැස්සේ කුඩයක් ද ඉහලාගෙන සිටින රසී නංගී ය. යන්තම් තිබූ මත් ගතිය නොවන්නට සමහරවිට ඇය අසල සයිකලය නො නවතින්නට ද ඉඩ තිබුණි.

වේගය මදක් පාලනය වුණු සයිකලය නැවතුනේ රසී නංගීගේ දෙපා ළඟම ය. බිමට පයක් තබා මම පෑ සිනාවට ඇයගේ ද ප්‍රති පෝෂණය නො අඩුව ලැබුණි.

"නංගි ඇයි රෑ වෙලා. බස් එක නැද්ද ?"

"අද ටිකක් රෑ වුණා අයියෙ. අද පැයක් විතර වැඩිය ඉන්න උනා. හෙට ෂිප්මන්ට් එකට බඩු දාන්න තියෙනවා. ඇය ගේ රැකියාව පිළිබඳව හෝඩුවාවක් දැනුණේ එවිට ය.

"නංගි දැන් කොහෙද වැඩ කරන්නේ."

"එස්. ඒ. ගාමන්ට් ඔෆිස් එකේ."

"ඉතින් නංගි රෑ උණානෙ. දැන් බස් එක කීයටද තියෙන්නෙ. නමයහමාරේ බස් එකනෙ ඇත්තෙ. රෑ වෙනවනෙ. අනික නංගිට මෙතැන තනියම ඉන්න පුළුවනෑ. යං නංගි මං ගිහින් ඇරලන්නං."

"කමක් නෑ අයියෙ තව ටිකෙන් බස්සෙක එයිනෙ."

"කමක් නෑ නගින්නකො."

එවිට ඇය අත තිබූ ලේන්සුවෙන් සයිකලයේ ෂීට් එක පිස දමා කුඩය හකුළාගෙන සයිකලයට ගොඩ වූවා ය.

"හෙමින් යං"

"ඇයි බයද" මගේ හැකියාව පෙන්වන්නට මෙය හොඳ වෙලාවක් යැයි මත්බර සිතට සිතෙන්නට ඇත. සයිකලය ඉදිරියට ඇදුණේ සාමාන්‍ය පිළිවෙලට වඩා තරමක් වෙනස් ව ය. ඉදිරියට එන වාහනය ළඟට ම ගොස් සයිකලය නවා නැවත කෙළින් කොට ගැනීමට මට හිතුණේ. "වැඩ පෙන්වීමට" විය හැකි ය. නැවුණු සයිකලය නැවත පාරට කෙළින් නොවී ගිහින් හැපුණේ ටෙලිපෝන් කණුවක ය. එතැනින් නොනැවතුණු සයිකලය අසල නවතා තිබූ ලොරියකද වැදිණි.

ඉන්පසු කිසිවක් කියන්නට මතක නැත. එහෙත් මහා බියකරු දර්ශනයක් මා ඉදිරියේ මැවී පෙනේ. ඇස් යළි පියා ගැනීමට අපහසුවා මෙනි. ඇස් පියාගත් විගස ම මා ඉදිරියේ උපහාසාත්මක මුහුණින් බලා සිටින්නේ මාගේ බිරිඳ ය. එහි තෙත් ගතියක් හෝ කාරුණාවක් නැත. දෙසවන් දෝංකාරය දී ඇසෙන්නේ "යන්කො ගෙදර" යන බියකරු වචන දෙක පමණි.

***සනත් පියසේන ගේ "වැව් කණ්ඩිය උඩ" කෙටිකතා සංග්‍රහයෙනි***